OL/2010/62-S-I,II
සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 | S | I,II

11052

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I,II
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I,II
Citizenship Education & Governance/Civic & Governance I,II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය :..............................

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

● අංක **1** සිට **8** තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක
   (1) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වේ.
   (2) පාලන ක්‍රියාවලිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව සිදු නොවේ.
   (3) තරඟකාරී පක්ෂ ක්‍රමයක් දකිය නොහැකියි.
   (4) නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක නොවේ. (.........)

2. ආණ්ඩුව
   (1) ජනතාවගේ පොදු අභිමතය නියෝජනය කරයි.
   (2) රාජ්‍යයේ එක් අංගයකි.
   (3) ස්ථාවර ආයතනයකි.
   (4) විවිධ ස්වරූප නොපවතී. (.........)

3. ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණය වන්නේ
   (1) ජනාධිපති ව්‍යවස්ථාදායකය මගින් තෝරා ගනු ලැබීමයි.
   (2) ව්‍යවස්ථාදායක මණ්ඩලය තුළ විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමෙන් ජනාධිපති ඉවත් කළ හැකි වීමයි.
   (3) ජනාධිපති නාමික විධායකයකු වීමයි.
   (4) වලංගු ධූරකාලය තුළදී ජනාධිපති එම නිලයෙන් ඉවත් කළ හැකි වීමයි. (.........)

4. නූතන ජාතික රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ
   (1) එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීමයි.
   (2) වෘත්තීය නිලබල පැලැන්තියක් මගින් පාලනය නොවීමයි.
   (3) මධ්‍යගත පාලන ක්‍රමයක් නොමැති වීමයි.
   (4) අභ්‍යන්තර හා බාහිර ස්වාධිපත්‍යය බලයක් නොපැවතීමයි. (.........)

[ දෙවැනි පිටුව බලන්න.

● පහතින් දක්වෙන්නේ ආණ්ඩුවේ කාර්යභාරයන් සමූහයකි. ඒවා අනුසාරයෙන් අංක **5** සහ **6** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මූල්‍ය පාලනය
B - රාජ්‍ය සේවය පාලනය කිරීම
C - නීති විවරණය කිරීම
D - විදේශ සම්බන්ධතා පාලනය කිරීම
E - පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
F - යුක්තිය පසිඳලීම
G - නියෝග හා ආඥා නිකුත් කිරීම

5. විධායකයට අයත් කාර්ය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) DEF (3) BDG (4) EFG (.........)

6. අධිකරණයට අයත් කාර්ය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) CDE (3) EFG (4) CEF (.........)

● පහත දක්වෙන්නේ පාර්ලිමේන්තු සහ ජනාධිපති ආණ්ඩුක්‍රමවල අඩංගු මූලික ලක්ෂණ කිහිපයකි. ඒවා අනුසාරයෙන් අංක **7** සහ **8** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොසිටී.
B - විධායකය හා ව්‍යවස්ථාදායකය අතර කිට්ටු සම්බන්ධයක් පවතී.
C - විධායක බලය ක්‍රියාත්මක කරන්නේ ජනාධිපතිවරයා විසිනි.
D - අගමැති සහ කැබිනට් මණ්ලය ව්‍යවස්ථාදායකයෙන් තෝරා ගනී.
E - විධායක බලය අගමැති සහ කැබිනට් මණ්ඩලය මගින් හසුරුවයි.
F - ජනාධිපති වලංගු ධූරකාලය තුළදී දෝෂාභියෝගයක් මගින් ඉවත් කළ හැකි ය.

7. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට අයත් ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) CDE (3) DEF (4) BDE (.........)

8. ජනාධිපති ආණ්ඩුක්‍රමයට අයත් ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) ABC (2) CDE (3) ACF (4) DEF (.........)

● අංක **9** සිට **18** තෙක් එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කරන්න.

9. සාර්ක් සංවිධානයේ වර්තමාන සභාපති ධූරය උසුලනු ලබන්නේ ශ්‍රී ලංකාවයි. (.........)

10. ව්‍යවස්ථාදායකයේ අනුමැතියකින් තොරව බදු පැනවිය හැක. (.........)

11. රාජ්‍යයක මූලික නීතිය අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. (.........)

12. නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීම යහ පාලනයක ගුණාංගයකි. (.........)

13. සන්ධීය පාලන ක්‍රමයක දී මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බලය බෙදීමක් දකිය නොහැක. (.........)

14. මිනිසුන්ගේ බාහිර සහ අභ්‍යන්තර හැසිරීම පාලනය කිරීම සඳහා රාජ්‍යය විසින් පනවන ලද රෙගුලාසි නීති වේ. (.........)

15. දේපළ සම්බන්ධ කරුණු සිවිල් නීතිය යටතට ඇතුළත් වේ. (.........)

16. ශ්‍රී ලංකාවේ ඉහළම අභියාචනාධිකරණය මහාධිකරණයයි. (.........)

17. සියලු ආකාරයේ සිවිල් නඩු සම්බන්ධයෙන් කටයුතු කරනුයේ දිසා අධිකරණයයි. (.........)

18. රාජ්‍ය සේවකයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම පිළිබඳ චෝදනා පරීක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ වගකීමයි. (.........)

[ අනෙක් පිටුව බලන්න.

- අංක 19 සිට 32 තෙක් එක් එක් වගන්තිය අවසානයේ දක්වෙන වරහන තුළින් ගැළපෙන වචනය/වචන තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

19. 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් ශ්‍රී ලංකාවේ අණ්ඩුක්‍රමය ගොඩ නගා ඇත්තේ ..................................................................................................................................... ය.
(ඇමෙරිකා ආකෘතිය අනුව / වෙස්මිනිස්ටර් ආකෘතියට අනුව / ඇමෙරිකා, ප්‍රංශ සහ වෙස්මිනිස්ටර් ආකෘතිවලට අනුව)

20. නීතියේ ආධිපත්‍යය සංකල්පය යටතට .......................................................................... ඇතුළත් වේ.
(නීති විවිධාකාරයෙන් අර්ථ නිරූපණය කිරීම / නීතිය ඉදිරියේ සියලු දෙනාම සමාන බව / නීති දේව නිර්මාණයක් බව)

21. තේසවලාමෙයි නීතිය .......................................................................................... අදාළ වේ.
(මුළු දිවයිනටම / පහතරට ජන කොටස් සඳහා / යාපනයේ ජීවත්වන ජන කොටස් සඳහා)

22. ශ්‍රී ලංකාවේ බලය බෙදීම සඳහා පියවර ගෙන තිබෙන්නේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ .......................................................................................................මගිනි.
(නවවන සංශෝධනය / දෙළොස්වන සංශෝධනය / දහතුන්වන සංශෝධනය)

23. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාව හැඳින්වූයේ .............................................. නමිනි.
(ජාතික රාජ්‍ය සභාව / පාර්ලිමේන්තුව / රාජ්‍ය මන්ත්‍රණ සභාව)

24. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ...................................................................... අඩංගු කරන ලදී.
(මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් / සුළු ජන අයිතිවාසිකම් පිළිබඳ වගන්තියක් / ඔම්බුඩ්ස්මන් ධූරයක්)

25. ශ්‍රී ලංකාවේ පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ........................................................................................................................... හඳුන්වා දෙන ලදී.
(නාමික විධායක ජනාධිපති ධූරයක් / මූලික අයිතිවාසිකම් කඩවූ විට ගත හැකි ක්‍රියා මාර්ග / ජනමත විචාරණය)

26. සිවිල් හෝ අපරාධ නඩුවල දී රජයේ පාර්ශ්වය නියෝජනය කරන්නේ ............................................ ය.
(පොලිස්පති / හමුදපති / නීතිපති)

27. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ ......................................................................................................................... ය.
(අභියාචනාධිකරණයේ සභාපතිවරයා / අග්‍ර විනිශ්චයකාරවරයා / නීතිපතිවරයා)

28. මහ නගර සභා, නගර සභා සහ ...................................................... ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ආයතන ලෙස සැලකේ.
(සුළු නගර සභා / ගම්කාර්ය සභා / ප්‍රාදේශීය සභා)

29. එක්සත් ජාතීන්ගේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අත්සන් කරන්නට යෙදුණේ.............................. වර්ෂයේ දී ය.
(1948 / 1979 / 1989)

30. මානව සංවර්ධන දර්ශකය යටතට ආයු අපේක්ෂාව, සාක්ෂරතාවය සහ ................................................................................................................................. ඇතුළත් වේ.
(ළදරු මරණ අනුපාතිකය / පානීය ජල පහසුකම් / ක්‍රය ශක්තිය මත ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය)

[ හතරවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

31. රාජ්‍ය උපාය සබඳතා සහ ........................................................ අන්තර්ජාතික සබඳතා ක්ෂේත්‍රයට අයත් වේ. (වෙළෙඳ සබඳතා / තාක්ෂණික සබඳතා / යුද්ධ උපාය සබඳතා)

32. දනට ලෝකයේ ක්‍රියාත්මක වන කලාපීය යුද්ධ සංවිධානයක් වන්නේ .................................... සංවිධානයයි. (වෝර්සෝ / නේටෝ / ආසියාන්)

- අංක 33 සිට 40 තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** ප්‍රකාශය තෝරා එහි අංකය ඉදිරියේ ඇති **වරහන** තුළ ලියන්න.

33. නීතිය
 (1) අධිකාරි බලය පදනම් කර ගෙන රාජ්‍ය විසින් පනවනු ලැබේ.
 (2) සමාජයේ පොදු යහපත අරමුණු කොට පැනවේ.
 (3) වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වේ.
 (4) පුද්ගලයාගේ අභ්‍යන්තර හා බාහිර හැසිරීම පාලනය කිරීම අරමුණු කොට පැනවේ. (.........)

34. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
 (1) රටක මූලික නීතියයි.
 (2) සෑම නීතියක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ සම්පාදනය වේ.
 (3) දනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ 1978 අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
 (4) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සාමාන්‍ය බහුතර ඡන්දයෙන් සංශෝධනය කළ හැකි වේ.(.........)

35. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
 (1) ශ්‍රී ලංකාව ජන රජයක් බවට පත් විය.
 (2) ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත විය.
 (3) අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි කරමින් නාමික ජනාධිපති ධූරයක් ස්ථාපිත විය.
 (4) සමානුපාතික නියෝජන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. (.........)

36. පරිසරයේ භෞතික සංරචක ලෙස සැලකෙන්නේ
 (1) පස (2) ජලය (3) සතුන් (4) වායුව (.........)

37. සංවර්ධන ක්‍රියාවලිය මැනීම සඳහා යොදා ගැනෙන නූතන මිනුම් ක්‍රම
 (1) භෞතික ජීවන තත්ත්ව දර්ශකය (2) මානව සංවර්ධන දර්ශකය
 (3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (4) මානව දරිද්‍රතා දර්ශකය (.........)

38. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය
 (1) ස්ථාවර සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සහ ස්ථාවර නොවන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත වේ.
 (2) ස්ථාවර නොවන සාමාජිකයින් මහා මණ්ඩලය මගින් වසර දෙකක කාලයකට පත් කරනු ලැබේ.
 (3) අන්තර් ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම මූලික වගකීම වේ.
 (4) තීරණ ගැනීමේ දී මහ බලවතුන්ගේ නිෂේධ බලයට යටත් ය. (.........)

39. සාර්ක් සංවිධානයට අයත් රටවල් වන්නේ
 (1) ශ්‍රී ලංකාව (2) ඉන්දියාව (3) පකිස්ථානය (4) ඉන්දුනීසියාව (.........)

40. විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන වන්නේ
 (1) යුරෝපා පොදු වෙළෙඳ හවුල
 (2) උන්ක්ටාඩ් සංවිධානය
 (3) ලෝක වෙළෙඳ සංවිධානය
 (4) ඔපෙක් සංවිධානය (.........)

* *

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I,II
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I,II
Citizenship Education & Governance/Civic & Governance I,II

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය II

※ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) ග්‍රීක සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ලක්ෂණ දෙකක් ලියන්න.
(ii) ජාතික රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** ලියන්න.
(iii) ඒකීය රාජ්‍යයක මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.
(iv) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.
(v) ධනවාදී ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.
(vi) ගැටුම් නිරාකරණයේ දී අනුගමනය කරන ක්‍රම දෙකක් ලියන්න.
(vii) ශ්‍රී ලංකාවේ මහාධිකරණය සතු බලතල **දෙකක්** ලියන්න.
(viii) ශ්‍රී ලංකාවේ මහ නගර සභාවලට අයත් බලතල දෙකක් ලියන්න.
(ix) දේශපාලන අයිතිවාසිකම් **දෙකක්** ලියන්න.
(x) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සතු බලතල **දෙකක්** ලියන්න. *(ලකුණු 02 × 10 - 20 යි)*

**2.** විමධ්‍යගතකරණ ක්‍රියාවලිය නූතන රාජ්‍යය තුළ දැකිය හැකි පොදු ප්‍රවණතාවයකි.
(i) විමධ්‍යගතකරණ සංකල්පය නිර්වචනය කරන්න. *(ලකුණු 02 යි)*
(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන පළාත් පාලන ආයතන පිහිටුවීමට පදනම් වූ ආඥා පනත් **තුන** ලියන්න. *(ලකුණු 03 යි)*
(iii) ශ්‍රී ලංකාවේ පළාත්පාලන ආයතනවල නූතනයේ දැකිය හැකි ගැටලු දෙකක් සඳහන් කොට ඒවායින් **එකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

**3.** ගැටුම් සෑම සමාජයක් තුළම නොවැළැක්විය හැකි සංසිද්ධියකි.
(i) ගැටුම් ඇතිවීමට බලපාන සාධක **දෙකක්** ලියන්න. *(ලකුණු 02 යි)*
(ii) ගැටුම් නිරාකරණය කර ගන්නා ක්‍රම **තුනක්** ලියන්න. *(ලකුණු 03 යි)*
(iii) ගැටුම් නිරාකරණයේ දී මැදිහත්කරුවකු සතු විය යුතු ගුණාංග දෙකක් සඳහන් කොට ඒවායින් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**4.** ව්‍යවස්ථානුකූලවාදය නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.
(i) ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු බලතල **දෙකක්** ලියන්න. *(ලකුණු 02 යි)*
(ii) දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය ඇතිකිරීම සඳහා ගෙන ඇති විධිවිධාන **තුනක්** නම් කරන්න. *(ලකුණු 03 යි)*
(iii) මානව අයිතිවාසිකම් වර්ග දෙකක් සඳහන් කොට ඒවායින් **එකක** ඇති වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි)*

[ හයවැනි පිටුව බලන්න.

5. රටක සංවර්ධනයේ දී ආර්ථිකය නිවැරදිව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි.
   (i) වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   (ii) සමාජවාදී ආර්ථික ක්‍රමයක ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   (iii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ආර්ථික ගැටලු දෙකක් සඳහන් කොට ඒවායින් **එකක** වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. පරිසරය ආරක්ෂා කරගැනීමෙන් තොරව මිහිතලය මත වාසය කරන ජීවීන්ට පැවැත්මක් නොමැත.
   (i) පරිසරසරය සම්බන්ධයෙන් පුරවැසියන් සතුවන වගකීම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   (ii) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණයට සම්බන්ධවන ආයතන **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   (iii) පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කොට ඒවායින් **එකක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි).

7. අන්තර්ජාතික සංවිධාන අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ දකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි.
   (i) අන්තර්ජාතික සංවිධාන **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   (ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   (iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලෝක සාමය ඇතිකිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කොට ඒවායින් **එකක** ඇති වැදගත්කම කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

***

PAST PAPERS WIKI